
# චීනයෙන් හටගත් සාර්ස්

**වර්තමානය වන විට ලෝකයේ පැතිරෙමින් පැවති දරුණුම හා භයානක රෝගයක් ලෙස සාර්ස් (SARS)හැඳින්විය හැකිය. ඒඩ්ස් වැනි මාරාන්තික රෝගයක් වන මේ සඳහා තවමත් නිසි ප්‍රතිකාර සොයා ගෙන නොමැත.**

මෙම රෝගයට අදාළ ප්‍රථම රෝගියා චීනයේ ගුවාන්ඩොන්ග් ප්‍රාන්තයෙන් සොයා ගත් බව සඳහන් වේ. උග්‍ර තීව්‍ර ශ්වසන සහලක්ෂණය(Severe Accut Respiratory Sundrome – SARS)ලෙස හඳුන්වන අතර මේ වන විට චීනයේ බොහෝ පළාත්වලින් මේ සම්බන්ධ සිදුවීම් රාශියක් වාර්තා වී තිබේ. මේ සාර්ස් රෝගය පැතිරීම සම්බන්ධව බොහෝ කරුණු අනාවරණය නොවී පැවතීම නිසා චීනයේ රට අභ්‍යන්තරයට පැතිරීමේ තර්ජනයට මුහුණ පා සිටී.





## අශෝකා විජේසේකර

චීනයේ බොහෝ රෝහල් වලින් මේ වන විට සාර්ස් රෝගය සම්බන්ධ සිද්ධි වාර්තා වේ. මේ අතර චීන ජපාන මිත්‍රත්ව රෝහල වෙත ලෙඩුන් ගෙන එන ගිලන්රථ ශීඝ්‍රයෙන් ඇදී එන්නට විය. මෙහි සිටි රෝගීන් අතරින් 31 දෙනෙක් කහිමින්, වෙව්ලමින්, ආශ්වාස ප්‍රාශ්වාස කිරීමට අපහසු බවින් පෙළී තිබුණි. රෝහලේ හෙදියන් විසින් වහාම ඔවුන් හුදෙකලා කොට රෝහලේ වෙනම පැත්තකට යොමු කරනු ලැබීය.

මේ ආකාරයෙන් සාර්ස් රෝගය සම්බන්ධයෙන් අනතුරුදායක භයානක තත්ත්වයක් පවතින අවස්ථාවේ මෙම රෝහල කරා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉතා දක්ෂ වෛද්‍ය කණ්ඩායමක් මේ පිළිබඳ තොරතුරු සෙවීම සඳහා පැමිණියහ. බීජිංවල දිනෙන් දින ඉහළ යමින් පවතින සාර්ස් රෝගය සම්බන්ධව නිවැරදි තොරතුරු දැන ගැනීම ඔවුන්ට අවශ්‍ය වී තිබිණි. නමුත් ඔවුන් රෝහලේ සැරිසරා නිවැරදි තොරතුරු ඉදිරිපත් කරනවා වෙනුවට ජනතාව නොමඟ යවන සුළු තොරතුරු ඉදිරිපත් කරනු ලැබීය.

මෙම රෝගය තවත් ඉහළට ඔසවා තබමින් ඉතාමත් භයානක ප්‍රවෘත්ති ඉදිරිපත් කරනු ලැබීය. ඒ වන විටත් සාර්ස් රෝගය වැළඳුනු රෝගීන් දෙදෙනෙකු සිටි බව ඔවුන් පැවසූහ. මේ නිසා බීජිං නගරයේ ලෙඩුන් ගෙන යන ගිලන්රථ පවා වෙනත් වක්‍ර මාර්ග වලින් රෝහල මගහැර යන්නට විය. චීනයේ බීජිං නුවර මෙම සාර්ස් රෝගය ඉතා ඉක්මනින් පැතිරෙමින් තිබුණද මේ සම්බන්ධව (සාර්ස් වෛරසය) කිසිදු පරීක්ෂණයක් සිදු කිරීමට කිසිදු වෛද්‍ය කණ්ඩායමක් ඉදිරිපත් වී නොමැති බවත් දක්නට ලැබුණි.

බීජිංවල People's Liberation Army No. 309 රෝහල් ආරංචි මාර්ග වලට අනුව එහි සිටි සාර්ස් වැළඳුන ලෙස සැලකෙන රෝගීන් 46 දෙනෙක් ඉතාමත් අමාරුවෙන් ඔවුන්ගේ ඇඳවල් වලින් පිටවී ගිය බව සඳහන් වෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ කණ්ඩායම රෝහලට පැමිණීමට පෙර මෙය සිදුවී තිබෙනවා. මේ ආකාරයට සාර්ස් රෝගය සම්බන්ධයෙන් රෝගීන් සම්බන්ධ සිදුවීම් 200 සිට 300 දක්වා සිදුවී තිබෙන බව අභ්‍යන්තර සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් හෙළිකර දී තිබේ.

නමුත් චීන ජපන් මිත්‍රත්ව රෝහලේ වෛද්‍යවරයෙක් පවසා තිබුණේ මේ සම්බන්ධව වෙනත් තොරතුරු කිසිවක් පවසා සිය රැකියාව නැති කර ගැනීමට ඔහුට නොහැකි බවයි. එසේම එය මේ පිළිබඳ කිසිදු වගකීමකින් තොරව කටයුතු කරන බව හෙළි විය.

ජාත්‍යන්තර වශයෙන් පැතිරීගෙන යන මෙවැනි දරුණු ව්‍යසන සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකොට සෞඛ්‍ය හා මහජන සම්බන්ධතාවන් අඩාල වීම තිශ්වල ක්‍රියාවක් වන බව ජාත්‍යන්තර ප්‍රජාව අසත්‍ය සංඛ්‍යා ලේඛන විශ්වාස නොකරන බවත් ලෝක සෞඛ්‍ය සංවිධානයේ චීන නියෝජිත හෙන්ක් බෙකඩම් පවසා තිබුණි.

සාර්ස් රෝගය චීනයේ අවසන් ලකුණක් වේද යන්න බොහෝ දෙනා අද විමසිල්ලෙන් සිටී.


මේ වන විටත් චීනයේ බොහොමයක් පිටිසරබද පළාත්වල මෙය පැතිරෙමින් පවතී.

සාර්ස් රෝගය සඳහාම සූදානම් කරනු ලැබූ රෝහල් සකස් කොට තිබෙනා අතර ඒවා සඳහා වැඩි මිල ගණන් අය කරන බවද සඳහන් වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ චීන නියෝජිත බෙකඩම් පවසන පරිදි චීනයේ පිට පළාත්වල අද මෙය ලොකු වෙළඳමක් බවට පත් කර ගෙන තිබේ.

චීනයේ ෆාර් ප්ලුන්ග් ෂැන්ෂි (FAR FLUNG SHANXI) පළාත තුළින් ද සාර්ස් රෝගය සම්බන්ධ සිදුවීම් වාර්තා වී තිබුණි. සාර්ස් රෝගය පිළිබඳ මුල්ම එල්ල කිරීම සිදු වුනේ ග්වැන්ඩොන්ග් වලිනි.

ෆාර් ප්‍රදේශයේ රෝහල්වල රෝගීන්ට මුදල් සපයා දෙමින් ඔවුන්ට නිසි වෛද්‍ය ප්‍රතිකාර ලැබුණ කියල පොරොන්දු කරව ගන්නව.

බොහෝ දුප්පත් සාර්ස් රෝගීන්



මේ ආකාරයෙන් මුලා කර ගන්නා බව මේ පළාතෙන් වාර්තා වී තිබුණි.

ඒවගේම චීනයේ ටැයිටැන් (Taiyuan) නගරයේ ෂුට් පළාතේ සාර්ස් රෝගයට අදාළව තවත් සිද්ධියක් වාර්තා වෙලා තියෙනවා. මෙම පළාත් මෙම රෝගය පතුරුවන අයට වෙනම මුදල් ගෙවන බව සඳහන් කොට තිබූ හැන් තමින් හඳුන්වනු ලැබූ පවුලේ මාසික ආදායම 60 ක් වන ශිෂ්‍යයෙක් සඳහා මෙම සාර්ස් රෝග පැතිරවීම සඳහා රෝහලේ සිටි දින හතරක් සඳහා 240 ක් ලබා දී තිබුණි.

චීනයේ වෛද්‍යවරු මේ වන විට දේශපාලන පීඩනයන්ට හසුවීමත් සමග සාර්ස් රෝග සම්බන්ධ තොරතුරු සඟවමින් මෙහි භයානක තත්ත්වය ගැන අනාවරණය නොකර දේශපාලකයන්ට අවනත වී සිටින බව පැහැදිලිව පෙනෙන කරුණක් වී තිබේ.

ටයිටැන් (Taiyuan) පළාතේ වෛද්‍යවරයකු වන ෆැන්ග් හැන්වි (Zhang Hanwei) පවසන පරිදි සාර්ස් රෝගය සම්බන්ධයෙන් දැනට වාර්තාවන තොරතුරු ගැන චීන රජය කිසිමවිටෙක සෑහීමට පත් නොවන බව පවසනවා. මේ වන විට සාර්ස් රෝගය සම්බන්ධයෙන් 4% පමණ මරණ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වන අතර ෂැන්ෂි පළාතේ තිල ලත් සාර්ස් රෝගීන් 82 ක් ද ඉන් 17 ක් මිය ගිය බව ද වාර්තා වී තිබේ. මරණ සිදුවීමේ වේගය 8.5% බවද සඳහන් වේ.

මෙම පළාතේ නායකයන් ද මෙම තොරතුරු සම්බන්ධව තරහින් පසුවන බවයි වාර්තා වන්නේ. සාර්ස් රෝගය සම්බන්ධ වාර්තා ලබා ගැනීමට අලුත් ප්‍රතිපත්තියක් (මිනුම් ක්‍රමයක්) ද ෂැන්ග් විසින් නිවේදනය කරනු ලැබීය. එය හැඳින්වූයේ"Therr Nos" වශයෙනි. මෙහිදී චීනයේ කොමියුනිස්ට් පක්ෂ ඉහළ නිලධාරීන් ප්‍රසිද්ධ දෙපාර්තමේන්තු හා ඉහළ ප්‍රචාරක කාර්යාල ඉතා ඉක්මනින් මේ පළාතට පැමිණියහ.

එහිදී සාර්ස් රෝගයේ ස්වභාවය මාධ්‍යයට තොරතුරු හෙළි නොකළ යුතු බවත් මෙම රෝගයට ප්‍රතිකාර කරන පළපුරුදු වෛද්‍යවරු මහජනයා සමග සම්බන්ධ නොවීමත්,

**සාර්ස් රෝගය සම්බන්ධ වාර්තා ලබා ගැනීමට අලුත් ප්‍රතිපත්තියක් (මිනුම් ක්‍රමයක්) ද ශැන්ග් විසින් නිවේදනය කරනු ලැබීය. එය හැඳින්වූයේ"Therr Nos" වශයෙනි. මෙහිදී චීනයේ කොමියුනිස්ට් පක්ෂ ඉහළ නිලධාරීන් ප්‍රසිද්ධ දෙපාර්තමේන්තු හා ඉහළ ප්‍රචාරක කාර්යාල ඉතා ඉක්මනින් මේ පළාතට පැමිණියහ.**

සාර්ස් රෝගයට ලෝක සෞඛ්‍ය සංවිධානය සමග කිසිම ගනුදෙනුවක් නොකරන්නටත් මෙම රෝගයට ඔවුන්ගේ සහය ලබා ගැනීම නොකළ යුතු බවත් ජාත්‍යන්තර වශයෙන් ඉතා දක්ෂ පළපුරුදු විශේෂඥ වෛද්‍යවරු මෙම ෆැන්සි පළාතේ සැරිසරන බවත් ඔවුන් සඳහන් කොට තිබේ. මේ ආකාරයෙන් ජනතාව පුදුමයට හා මවිතයට පත් කරන සාර්ස් රෝගය සඟවමින් ඒ සම්බන්ධ තොරතුරු හෙළි නොකරන ලෙස අනතුරු අඟවමින් රැස්වීම් පවත්වා තිබේ.

චීනයේ සාර්ස් රෝගය වැළඳුනු බොහොමයක් රෝගීන් ටැසියැන්වල පරණ වී ගිය රෝහල්වල සිටින බව සඳහන් වේ.

ෆැන්සි පළාතෙන් මෙම රෝගය සම්බන්ධව තවත් සිදුවීමක් වාර්තා වෙනවා. අවුරුදු 20ක් පමණ වන ශිෂ්‍යයෙකු පසුගිය සතියේ දිනෙක රෝගාතුර වී රෝහල් ගත විය. ඔහුට සහාය පිණිස ඇගේ සහෝදරියත් ඇගේ පෙම්වතා වන ලියැන්ග් ද රෝහලට පැමිණියහ. මෙම රෝගියා නවත්වන ලද වාට්ටුව තුළ සාර්ස් වැළඳුනු රෝගියෙක් සිටියද හෙදියන් විසින් එය වසන් කොට තිබෙනවා. ලියැන්ග් නිදිවර්ජිතව තම මිතුරා බලා ගනිමින් රෝහලේ සිටියේය. මෙම වාට්ටුවේ විසූ සාර්ස් ආසාදිත රෝගියා ද එදින මිය ගියේය. ඔහු බැලීමට පැමිණි පවුල් පහේම නෑදෑයන්ට මෙම රෝගය වැළඳිණි. ලීයැන්ග් පවසන පරිදි රෝගියා බැලීමට පැමිණි ලියැන්ගේ නෑදෑයෝ ද සාර්ස් රෝගයෙන් මිය ගිය පුද්ගලයාගේ නෑදෑයන් විසූ කාමරයේ සිටියහ.

ලියැන්ග් තුළ තම් තවමත් මෙම රෝග ලක්ෂණ පහළ වී නැත. නමුත් මේ ආකාරයෙන් චීනයේ රෝහල් තුළ සාර්ස් රෝගීන් සඟවාගෙන සිටීමෙන් රෝගය ශීඝ්‍රයෙන් පැතිරෙමින් යන බව සඳහන් වේ.

තවද ටයියැන් පළාතේ රෝහල්වල රෝගීන් වැඩිවීමත් සමග සාර්ස් ආසාදිත රෝගීන් ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කොට තිබේ. රෝහල්වල අනෙකුත් රෝගීන්ට මෙම සාර්ස් රෝගීන් බලවත් තර්ජනයක් වන බව රජය තේරුම් ගෙන නොතිබීම විශාල වරදකි.

මිනිසුන් ජීවත් වන ආකාරයත් රෝගීන්ට ආධාර නොදීමත් දිගින් දිගටම සිදු වේ. සාර්ස් රෝගය වැළඳුන අයට සිදු කරන ප්‍රතිකාර සඳහා ඉතා අධි මිල ගණන් අය කරන බවද සඳහන් වන අතර චීනයේ සාමාන්‍ය ජනතාවට එය අපහසු කරුණකි. මේ නිසාම චීනයේ රට අභ්‍යන්තරය පුරාම මෙම සාර්ස් රෝගය වැඩි වශයෙන් පැතිරියාමේ අවදානම වැඩිය.

චීනයේ අනෙක් පළාත්වලත් සාර්ස් රෝගය සම්බන්ධයෙන් සිදුවන සිදුවීම් ඉතාමත් භායනකයි. ෂික්හුයැන් (Sichuan) පළාතෙන් මිලියනයක් තරම් සේවක පිරිසක් එම පළාත අතහැර ගුවැන්ඩෝන්වලට ගොස් තිබේ. මෙම පළාත් මාරු කළ ද එහිදීත් මෙම රෝගය බෝවීම නිසා 6 කට වඩා මිය ගිය බව සඳහන් වී තිබේ.

චීනයේ උතුරුකරයේ තිබෙන මොන්ගෝලියා ලියූ, ෂුටැඕ යන

**පසුගිය මාර්තු 15 වනව දින හොංකොංවල සිට බීජිං දක්වා පැමිණි ගුවන් යානයකින් මෙම සාර්ස් රෝගය මාර්තු 17 වන දින වන විට හොව්හොට්වලට ලැබුණු බව සඳහන් වේ. මෙම ගුවන්යානයේ සිටි මගීන් භාරව සිටින සේවකයන් දෙදෙනෙකුට දින 10 ක් ගත වීමට පෙර රෝග ලක්ෂණ මතු විය. නමුත් නිල වශයෙන් ස්ථිර තත්ත්වයක් බව තහවුරු කර ගැනීම අපහසු විය. දේශීය වෛද්‍යවරු එය සාර්ස් විය හැකි බවට සැක කළහ.**

පළාත්වල ඇතුළත සාර්ස් රෝගීන් 19 ක් ද සැක කටයුතු රෝගීන් 13 ක් ද සිටි බව සඳහන් වේ. මෙම පළාත්වල නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂවරු පවසා තිබුනේ මෙම රෝගයේ පැතිරීම ගැන ඔවුන් සැලකිල්ලක් දක්වන බවයි. ලියූවල ප්‍රාදේශීය අගනුවර වූ හොව්හොට් (Hohhot) වලදී බීජිං නුවර ඉතා දක්ෂ තිල ලත් අය විසින් ද්‍රව්‍ය මුළුල්ලේ රාත්‍රියේ පවා මේ සම්බන්ධ රැස්වීම් පවත්වා තිබේ. මේ ආකාරයෙන් බීජිං නගරයේ සාර්ස් රෝගය සම්බන්ධ තොරතුරු සඟවන අතරතුරේදී ලියෝවල ඔවුන්ගේ සෞඛ්‍ය කණ්ඩායමක් මෙහෙයවනු ලැබුයේ මේ ආකාරයම අප්‍රසිද්ධියේ ඇත පළාත්වලට සාර්ස් රෝගය ළඟා වූයේ කෙසේ ද කියා දැන ගැනීම සඳහා ය.

දේශීය ගුවන් ගමන් මගින් මෙය චීනය පුරා ව්‍යාප්ත වී ඇති බවත් නිගමනය කරනවා.

පසුගිය මාර්තු 15 වනව දින හොංකොංවල සිට බීජිං දක්වා පැමිණි ගුවන් යානයකින් මෙම සාර්ස් රෝගය මාර්තු 17 වන දින වන විට හොව්හොට්වලට ලැබුණු බව සඳහන් වේ.

මෙම ගුවන්යානයේ සිටි මගීන් භාරව සිටින සේවකයන් දෙදෙනෙකුට දින 10 ක් ගත වීමට පෙර රෝග ලක්ෂණ මතු විය. නමුත් නිල වශයෙන් ස්ථිර තත්ත්වයක් බව තහවුරු කර ගැනීම අපහසු විය. දේශීය වෛද්‍යවරු එය සාර්ස් විය හැකි බවට සැක කළහ.

නමුත් සෞඛ්‍ය ආයෝජන අමාත්‍යාංශය විසින් මෙම ගුවන් යානය තුළ සැබැවින්ම සාර්ස් රෝගයට ගොදුරු වූ දෙදෙනෙක් සිටි බව තහවුරු කර දී තිබුණා.

ගුවන් යානයේ සිටි සාර්ස් රෝගයෙන් පෙළුණු පුද්ගලයා නිසා එහි සේවකයාටත් වෛරසය වැළඳී තිබුණි. අප්‍රේල් 11 වන තෙක් ස්ථිරවම සාර්සා වැළඳුනු රෝගීන් ගුවන් යානයේ මගීන් අතර සිටි බව සොයා ගෙන නොතිබිණි.

ගුවන්යානාවල ගමන් කරන අය හරහා මෙම වෛරසය ශරීරගත වීමට ඇති ඉඩකඩ වැඩිබවත් සඳහන් ය. චීනයේ ගුවන් ගමන් පිළිබඳ වෙබ් අඩවියේ සඳහන් වන්නේ ගුවන් ගමන් කණ්ඩායම් හරහා මෙම රෝගය පතුරවමින් සිටින බවයි.

බීජිං නගරයේ මෙම සාර්ස් රෝගීන් සඳහා වෙන්ව පවත්නා වාට්ටු නිර්මාණය කිරීමත් සාර්ස් රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී ප්‍රමාණවත් තරම් මුඛාවරණ සපයා ගැනීමටත් උත්සාහ ගෙන තිබේ. හොව් හොට් වගේ ආර්ථික වශයෙන් පීඩා විඳින නගරවලට ඉතා ඉක්මනින් අවශ්‍ය සම්පත් ගස් කර ගැනීමේ හැකියාව නොමැත. ඇමරිකාවේ මෙන් දියුණු රෝහල් ද මෙහි නොමැති බවත් මොංගෝලියානු ප්‍රචාරක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂකJia Xueyi පවසා තිබුණි.

මෙම සාර්ස් රෝගය සම්බන්ධයෙන් ප්‍රතිකාර වහාම සොයා ගත යුතු බව විශේෂඥ වෛද්‍ය Ma සඳහන් කර සිටී. ඔහු දැනටමත් මේ සම්බන්ධ පරීක්ෂණ ආරම්භ කොට තිබේ. මෑතකදී පෙනහැල්ල ඉදිමීමෙන් ඇතිවන රෝග තත්ත්වයක් හඳුනාගෙන ඇති අතර එය ද සාර්ස් ආශ්‍රිත වූවක් බව සඳහන් කර සිටී. නමුත් චීනයේ රට ඇතුළත සිටින අනෙක් වෛද්‍යවරුන් ඔහුගේ එළිදැරව් කිරීම් හා සංගණන ගැන සැක කරනු ලබනවා.

මෙම රෝගය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වෛද්‍යවරුන් අතර පවා ජර්වලතා තිබෙන බව වාර්තා වේ. බොහෝ වෛද්‍යවරුන් අපිරිසිදු ව සිටීමත්, එසේම සමහර රෝහල් ඉතා අපිරිසිදු තැන්වල පිහිටා තිබීමත් (උදා : තොරාසින්, හොව්හොට් නගරවල රෝහල් අයට අපිරිසිදුය) අලුත් ප්‍රතිකාර ක්‍රම ගැන සොයා බැලීම් නොකිරීම යනාදී හේතු නිසා මෙම සාර්ස් පැතිරීමේ අවදානම තවත් ඉහළ යමින් තිබේ. මේ වන විට චීනයේ ඇතැම් පාසල් පවා වසා දමා ඇත.

සාර්ස් රෝගය වර්තමානයේ පැතිරී යන ආකාර දෙස බලන විට ඉතා සමීප ආශ්‍රයෙන් අසාදිතයෙකුගෙන් නිරෝගී අයෙකු වෙත යැවිය හැකි බව පෙනී යයි. රෝගියාගෙන් පිටවන ශ්වාස බිංදු මගින් ආසාදනය ඇතිවන නිසා එය බිඳිති සම්ප්‍රේෂිත ආසාදනයක් ලෙස වෛද්‍යවරු සඳහන් කරති. මෙතෙක් මෙම රෝගය ආසාදිත පිරිස අතර

**රෝගය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වෛද්‍යවරුන් අතර පවා ජර්වලතා තිබෙන බව වාර්තා වේ. බොහෝ වෛද්‍යවරුන් අපිරිසිදු ව සිටීමත්, එසේම සමහර රෝහල් ඉතා අපිරිසිදු තැන්වල පිහිටා තිබීමත් (උදා : තොරාසින්, හොව්හොට් නගරවල රෝහල් අයට අපිරිසිදුය) අලුත් ප්‍රතිකාර ක්‍රම ගැන සොයා බැලීම් නොකිරීම යනාදී හේතු නිසා මෙම සාර්ස් පැතිරීමේ අවදානම තවත් ඉහළ යමින් තිබේ.**

ප්‍රතිකාර කළ වෛද්‍යවරු ඇතුළු රෝහල් සේවකයන්ගේ පවුල්වල සමීපතයන් වීම මගින් මෙම රෝගය සමීප ආශ්‍රයෙන් බෝවන බව තවදුරටත් තහවුරු කොට තිබේ.

චීනයේ රට අභ්‍යන්තරයේ පැතිරෙමින් පවතින මෙම දරුණු වසංගතය සඳහා විධිමත් ප්‍රතිකාර අවශ්‍ය වුවත් එසේ සිදු නොවීම තවදුරටත් මෙම රෝගය ව්‍යාප්ත වීමට රුකුලක් වෙනවා.

මොන්ගෝලියානු පළාතේ 50% පමණ තවමත් දේශීය රෝහල් ක්‍රමය පමණයි භාවිතා කරන්නේ. එම රෝහල්වල වෛද්‍යවරු පවා කටයුතු කරන්නේ ඉතාම අඩු පහසුකම් සහිතවයි. අධික ජනගහනය ඇති රටක් වශයෙන් චීනය තුළ මෙම තත්ත්වය වළක්වා ගැනීමට නම් රටේ සෞඛ්‍ය අධිකාරියේ ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය කාරණයක්ව පවතින්නේය. ❑